# සොහොන් කොත් මගින් හෙළිවන සමාජ ස්ථරායනය: විශේෂ අවධානය බොරැල්ල පොදු සුසාන භූමිය

එස්. ආර්. චමිලා කුමාරි

මුහුදු පුරාවිද්‍යා ඒකකය, ගාල්ල
ckrathnayaka15@gmail.com

## හැඳින්වීම

වසර දෙදහස් පන්සියකට අතීත ලාංකීය සංස්කෘතික ඉතිහාසය විවිධ වූ කලාවන්ගෙන් මෙරට ඉතිහාසය පෝෂණය කිරීමෙහිලා ඉවුකර ඇති මෙහෙය නෂ්ටාවශේෂ මිගින් දැකගත හැකිය. මෙම කලාවන් අතුරින් සොහොන් කලාවට හිමිවන ස්ථානය ද විශිෂ්ට වූවකි. බොරැල්ල පොදු සුසාන භූමිය ගත්විට එම කාරණය මැනවින් ගම්‍යමාන ය. මෙහි සොහොන් කොත් මිගින් පෙරනොවූ ආකාරයේ නිගමනයක් ලබාදිය හැකිවෙයි. එනම් මෙම සොහොන් කොත් මිගින් සමාජ ස්ථරායනය (Socal Structure) යන කාරණය මැනවින් තහවුරු වන හෙයිණි.

## ස්ථානීය වැදගත්කම හා පිහිටීම

පොදු සුසාන භූමි සංකල්පයේ ආරම්භය සිදු වී ඇත්තේ බ්‍රිතාන්‍ය පාලන සමයේදීය. 1803 දී ගාලු මුව දොර සුසාන භූමියත්, 1840 දී බොරැල්ල සුසාන භූමියත් කොළඹ විවෘතව ඇත (අමරකෝන්:2007.214 ). බොරැල්ල පොදු සුසාන භූමිය ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ අවසන් කටයුතු සිදු වූ ස්ථානයක් වෙයි. 1840 වසරෙහි ආරම්භය සිදු වූ යැයි සැලකෙන මෙම සුසාන භූමියෙහි ආරම්භයේ දී ඉංග්‍රීසි ජාතිකයන් සිදහා වෙන්ව පැවතී ඇති බවට තොරතුරු පර්යේෂණය මඟින් තහවුරු විය. පැරණි බොහෝ සුසාන ස්මාරක ඉංග්‍රීසි ජාතිකයන්ගේ නම් ගම් සහිතව සොයා ගත හැකි විය. 1866 න් පසුව ලිඛිත සාක්ෂි ඇති බොරැල්ල සුසාන භූමියෙහි වර්තමාන තත්ත්වය ගෙන බැලීමේ දී මෙය අංක 01, ඇල්විටිගල මාවත, කොළඹ 08 ලිපිනය දරණ ස්ථානයේ ලියාපදිංචිය තහවුරු කර ඇත. අක්කර 48-50 වන භූමි වපසරියක පැතිරීමක් ඇති මෙම සුසාන භූමිය ආවරණය වන ආකාරයට සිව්දෙසින් දොරටු පහක් දැකගත හැකිය. 1866 මෙහි ප්‍රථම මිහිදන් කිරීම සිදු වූ බවට ලිඛිත සාධක ඇති සේම, එය කාන්තාවකගේ මිහිදන් කිරීමක් බවට වාර්තා වී ඇත. සර් ජෝන් ඇන්ඩර්සන් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයාගේ මිහිදන් කටයුතු බොරැල්ල කනත්තේ කර ඇත. දෙවන ලෝක යුධ සමයේ ජපනුන් කොළඹට බෝම්බ හෙළූ අවස්ථාවේ ප්‍රතිප්‍රහාර වලින් මිය ගිය ජපන් භටයින් 06 දෙනෙකුගේ පමණ මෘතදේහ ද බොරැල්ල කනත්තෙහි මිහිදන් කර ඇත (කළුආරච්චි. 2004: 67 ).

## පර්යේෂණ ක්‍රමවේදය

සමාජ ස්ථරායනය හඳුන්වාදීමත්, බොරැල්ල සුසාන භූමියේ සුසාන වර්ගීකරණයත් සොහොන් කොත් මඟින් සමාජ ස්ථරායනය හඳුනා ගැනීම ද සිදු කරන ලදි.

- ප්‍රාථමික මූලාශ්‍ර
- ද්විතීයික මූලාශ්‍ර අධ්‍යයනය
- දත්ත හා තොරතුරු ලබා ගැනීම
- සම්මුඛ සාකච්ඡා පැවැත්වීම
- බොරැල්ල සොහොන් කොත් ඡායාරූප ගත කිරීම හා Scale ඡායාරූප ගැනීම
- සැලසුම් ඇඳීම ආදිය සිදුකරන ලදි.

**පර්යේෂණය**

ප්‍රාග්ඓතිහාසික යුගයේ සිට ඓතිහාසික යුගය දක්වා කාල පරාසය තුළ සමාජයෙහි පැහැදිලි සමාජ ස්තරායනයක් හඳුනාගත හැකි ය. එය කුලය, වෘත්තිය හා පන්ති ව්‍යුහය පදනම් කර ඇතිවූවකි. යටත් විජිත සමයෙහි ලංකාවේ සමාජය දෙස අවධානය යොමු කර බැලීමේ දී යම් වෙනසක් දැකිය හැකි ය. එනම් වෘත්තියට හා පන්ති ව්‍යුහයට අනුව මෙහි ස්තරායනය සකස් වී ඇති ආකාරයකි. ලංකාවේ පළමු අපරදිග පාලකයන් වූ පෘතුගීසින් කෝට්ටේ පාලකයන්ව මෙරට පැවති ආර්ථික සංවිධානය මෙම සමාජ රටාවේ විකාශනයේ එක්තරා අවස්ථාවක් ලෙස සැලකිය හැකි ය (බණ්ඩාර:2007.36). මිය ගිය පුද්ගලයන් උදෙසා ස්මාරක ඉදිකිරීම ක්‍රි. පූ. යුගයේ නැතහොත් මූල ඓතිහාසික යුගයෙහි පටන් කරනු ලැබූ කාර්යයක් බව පුරාවිද්‍යාත්මක සාධක තුළින් සනාථ වෙයි. ඒ අනුව යමින් අධ්‍යතන සමාජයෙහි ජීවත් වූවන් ද මෙය වගකීමක්, සිරිතක් ලෙස සලකා ඇත.

ධනවත් උසස් සමාජයෙහි පුද්ගලයන් ස්වකීය මිය ගිය ඥාතීන් උදෙසා ස්ථිර සුසාන ස්මාරක නිර්මාණය කිරීම සිදු වෙයි. එම සුසාන ස්මාරක නිර්මාණයන් මීගින් මිය ගිය පුද්ගලයාගේ උසස් පෞඩත්වය හා චරිත ලක්ෂණයන් මෙන් ම ආගමික සංකල්පයන් ආදී සුවිශේෂී තොරතුරු රාශියක් පිළිබිඹු වීම මෑත කාලීන නිර්මිත සුසාන ස්මාරක තුළින් පැහැදිලි වෙයි. මෙම නිර්මාණ උසස් කලා නිපුණතාවයකින් සංකේත, ලාංඡනයන් සහිත උසස් වාස්තු විද්‍යාත්මක තාක්ෂණයකින් සමලංකෘත ව නිර්මාණය කිරීමට එම නිර්මාණ ශිල්පීන් උත්සාහ දරා ඇත.

**ආගම අනුව වර්ගීකරණය කිරීම**

- බෞද්ධ හා හින්දු
- රෝමානු කතෝලික
- එංගලන්ත සභා
- පොදු ක්‍රිස්තියානි
- බැප්ටිස්
- මෙතෝ දිස්ත
- පෙස්මිකොස්ටස්

පුද්ගලයාගේ ආගම ක්‍රිස්තියානි, රෙපරමාදු වැනි නම් කුරුස සලකුණ ද බෞද්ධ නම් ධර්ම චක්‍රය සහිතව ද සොහොන් කොත නිර්මාණය කරනු ලබයි. ධර්ම චක්‍රය තුළින් චතුරාර්ය සත්‍යය පිළිබිඹු වෙයි. පද්මය ආගමික ලාංඡනයක් ය. ආගමෙහි මිය ගිය අය වෙනුවෙන් ජේසුස් වහන්සේ, මරියතුමිය සහ දේව දූතයන්ගේ සංකේත යොදනු ලබයි. ආගමෙහි සොහොන් කොත් සඳහා මල් බඳුන අඩක් රෙද්දකින් වසා තබන ආකාරයක් ද හඳුනා ගත හැකි වෙයි. ඔවුන්ගේ අවසාන අරමුණ වනුයේ ස්වර්ගයට ප්‍රවිශ්ටවීමයි. දේව දූතයන් ස්වර්ගයෙහි සිට පැමිණි අය හෙයින් මිය ගිය පුද්ගලයා ද ස්වර්ගයට ගොස් දේව දූතයකු බවට පත්වේ යැයි, යන විශ්වාසය හා ගෞරවය මත මෙසේ සොහොන් කොත්හි විශේෂයෙන් දේව දූත සංකේත යොදා ගෙන ඇත. උදා:- තෝමස් ඇල්බස්ට්න්, ප්‍රධාන මේසන්, අනගාරික ධර්මපාල තුමාගේ සොහොන.

**වෘත්තිය අනුව ස්ථරායනය හඳුනාගැනීම**

බ්‍රිතාන්‍ය සමාජයෙහි විශේෂ තිලකල, නම්බුනාම ලද පුද්ගලයන්ගේ සොහොන් කොත් හඳුනා ගත හැකි ය. සොහොන් කොත් මීගින් පිළිබිඹු වන සමාජ ස්තරායනය සෙවීමේ දී කුලය, ධනය, බලය මත නිර්මාණය වීම සිදු වී ඇත. ධනවතුන්, වංශවතුන් මිය ගිය අවස්ථාවේ දී නිර්මාණය කරනු ලබන සොහොන් කොත උපරිම නිර්මාණාත්මක අංගයන්ගෙන් පරිපූර්ණව නිර්මාණය වී ඇත. උදා:-සර්ව මුත්තු මහතාගේ ස්මාරකය, පෙන්රි ඩයස් මහතා වෙනුවෙන් ඉදි වූ ස්මාරකය, සර් ජෝන් ඇන්ඩර්සන් උදාහරණ ලෙසින් දැක්විය හැකිය.

**සොහොන් කොත් මගින් පිළිබිඹු කරන වාස්තු විද්‍යාත්මක ලක්ෂණ**

ඉංග්‍රීසි යුගයේ ක්‍රිස්තියානි ආගමෙහි මූලධර්ම පදනම් කොට ගත් වාස්තු විද්‍යාත්මක අංග දැක ගත හැකි ය. මේ සෑම ස්මාරකයක ම අන්තර්ගතය ඉංග්‍රීසි අක්ෂරයෙන් කොටා තිබීම විශේෂත්වයකි.

- චතුරස්‍රාකාර ස්මාරක
- කුරුස සංකේත සහිත ස්මාරක
- මිනී පෙට්ටි හැඩැති ස්මාරක
- මුදුනත ඕවලාකාර හැඩැති ස්මාරක

- චෛත්‍ය හා ගරාදි වැට හැඩැති ස්මාරක
- ගර්භ ගෘහ හැඩැති ස්මාරක
- විවිධ සංකේත සහිත ස්මාරක
- ධර්ම චක්‍ර සහිත ස්මාරක
- කුරුසය සහ ධර්ම චක්‍රය සහිත ස්මාරක

ආදී වශයෙන් ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැකිය. මෙම සොහොන් කොත්හි භාවිත සංකේත මේවා නිර්මිත මාධ්‍ය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වෙයි. උදා: අනගාරික ධර්මපාලතුමාගේ සොහොන් ස්මාරකයෙහි විශේෂ අංග කිහිපයක් හඳුනා ගත හැකිය.

### නිගමනය

සොහොන් කොත් මගින් පිළිබිඹු වන සමාජ ස්තරායනය සෙවීමේ දී පැහැදිලිව හඳුනා ගත හැකි ආකාරයට කුලය, ධනය, බලය මත සොහොන් කොත් නිර්මාණයවීම සිදු වී ඇත. සමස්ථයක් ලෙසට මේ ආකාරයෙන් සොහොන් කොත් අධ්‍යයනය කිරීම මගින් පැහැදිලිව හඳුනාගත හැකි ආකාරයේ සමාජ ස්තරායනයක් ගොඩනැගිය හැකි ය. සමාජ තත්ත්වය වෘත්තිය කුලය, නිලය මත හිමිවන්නකි. ඒ අනුව බොරැල්ල පොදු සුසාන භූමියෙහි සොහොන් කොත් මිගින් පිළිබිඹු වන සමාජ ස්තරායනය පිළිබඳ සිදු කරන අධ්‍යයනය සාර්ථක කර ගැනීමට ශේෂව ඇති දත්තයන් මගින් පැහැදිලිව හැකියාව ලැබූ බව සිදහන් කළ හැකි ය.

මුඛ්‍ය පද: බොරැල්ල සුසාන භූමිය, සොහොන් කොත්, සමාජ ස්තරායනය, සංකේත.

### ආශ්‍රෙය ග්‍රන්ථ

බ්‍රෝහියර්,ආර්.එල්. 2003. කොළොම්පුර පුරාවෘත්තය. පද්මා එදිරිසිංහ. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයො. පි. 59-70.

හුලුගල්ල, එච්. ඒ. ජේ. 1965. ශත සංවත්සර පුස්තකය කොළඹ නගර සභාව (1865-1965). කොළඹ: කොළඹ නාගරික සභාව. පි. 334-335.

ලෙවිස්, පෙන්රි. 2007. ලංකාවේ සොහොන් ස්ථම්භ. හද්‍රා ඉන්ද්‍රානි අමරකෝන්. පුංචි බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය. පි.

ARNOLD WRIGHT, 2008. ලංකාව විසිවැනි සියවසේ ධාරණාවෝ. සේපාල විජේසේකර. කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයො. පි.